මැයි 17 ඉරිදා මව්බිම පුවත්පතේ මුල් පිටුවේ "පොලිස් කොමිසමේ සභාපති කරුගේ රෙදි ගලවයි" යන ප්‍රධාන සිරස්තලය සහිතව පළ වූ ලිපියකි. මෙහි සඳහන් වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපති කරු ජයසූරිය විසින් ජාතික පොලිස් කොමිසම් සභාවට බලපෑම් කොට ඇතැයි කොමිසමේ සභාපතිවරයා විසින් කොමිසමේ සාමාජිකයින් හමුවේ පැවසූ බව "තතුදත් ආරංචි මාර්ග" ඔස්සේ වාර්තා වූ බවයි. එහි පුවත ලියූ මාධ්‍යවේදියෙකුගේ නමක් සඳහන් නොවුණි.

මේ අතර කරු ජයසූරිය විසින් සිය මාධ්‍ය සම්බන්ධීකරණ අංශය හරහා ජනමාධ්‍ය වෙත යොමු කරන ලද ලිපියකින් දක්වා සිටින්නේ, මෙම මව්බිම පුවත "...සාවද්‍ය හා ද්වේශ සහගත පුවත් පළ කිරීමේ කුප්‍රකට මාධ්‍ය භාවිතාව අනුවම පළ කරන ලද අසත්‍ය පුවතක්" වන බවටයි.

කෙසේ නමුත් මැයි 18 සඳුදා මව්බිම පුවත්පතේ මුල් පිටුවේ "කරු බොරු කියයි" යන ප්‍රධාන සිරස්තලය සමගින් පළවී ඇති පිළිතුරු ලිපියකි. එහිද මාධ්‍යවේදියෙකුගේ නමක් සඳහන් නොවේ. එහි කරු ජයසූරිය විසින් යැවූ මාධ්‍ය නිවේදනයද ඉදිරිපත් කර තිබේ. එනමුත් මව්බිම පුවත්පත පවසා සිටින්නේ තමන් මැයි 17 ඉරිදා ප්‍රකාශයට පත් කළ ලිපියේ අඩංගු කරුණු නිවැරදිය යන ස්ථාවරය තමන් දරනා බවත්, ඒ සම්බන්ධයෙන් සියල්ල සාධක සහිතව ඔප්පු කිරීමට මව්බිම සූදානම් බවත්, මෙම හෙළිදරව් කිරීම පිළිබඳ හැකි නම් නීති මගින් කටයුතු කරන මෙන් කරු ජයසූරිය හට තමන් අභියෝග කරන බවත් වේ.

මේ අතරම මැයි 18 සඳුදාම ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම් විසින් මව්බිම ප්‍රධාන කර්තෘ වෙත ලිපියක් යවයි. එහි කියැවෙන්නේ මැයි 17 මව්බිම ලිපියේ පළවූ පුවත මුළුමනින්ම සාවද්‍ය කරුණු මත නිර්මාණය කළ එකක් බවත්, ජාතික පොලිස් කොමිෂන් සභාව එම පුවත මුළුමනින්ම ප්‍රතික්ෂේප කරන බවත් වේ. එසේම මෙම පුවත පළ කිරීමට පෙර මව්බිම පුවත්පතේ කිසිදු මාධ්‍යවේදියෙකු පොලිස් කොමිසමේ සභාපතිවරයාගෙන් හෝ ලේකම් වරයාගෙන් කරුණු තහවුරු කරගෙන නොමැති බවද එම ලිපියේ දැක්වේ.

මේ සම්බන්ධයෙන් අපගේ නිරීක්ෂණයන් මෙසේයි. හැකි සෑම අවස්ථාවකම පිළිගත හැකි නිවැරදි මූලාශ්‍ර ඉදිරිපත් කිරීම ඔස්සේ පුවතක විශ්වසනීයත්වය ඉහළ යයි. කෙසේ නමුත් මූලාශ්‍රයේ අනන්‍යතාවය හෙළි කිරීමට මූලාශ්‍රයෙන් අවසර නොලැබෙන අවස්ථාවකදී එම අනන්‍යතාවය ආරක්ෂා කිරීම මාධ්‍යවේදියෙකුගේ ආචාර ධාර්මික වගකීමයි. කෙසේ නමුත් යම් මූලාශ්‍රයකින් ලබාදෙන තොරතුරක විශ්වසනීයත්වය තහවුරු කරගැනීම සඳහා, එකකට වැඩි විශ්වසනීය මූලාශ්‍ර පරිශීලනය කරන මෙන් ජනමාධ්‍ය මාර්ගෝපදේශනයන්හි දැක්වේ. එහිදී තමන් ලබාගත් තොරතුර අදාළ පොලිස් කොමිෂන් සභාවේ වගකිවයුත්තන්ගෙන් තහවුරු කරගැනීමට ක්‍රියා නොකිරීමෙන්, මව්බිම පුවත්පත වරදක් කර ඇත. එසේම පුවතක් ඉදිරිපත් කරනා මාධ්‍යවේදියෙකුගේ නම සඳහන් කිරීමට සෑම විටම දිරි දෙන අතර, එසේ නොවීම ඔස්සේද පුවතක විශ්වසනීයත්වය පහළ යයි. එසේ නම් සඳහන් වී නොමැති ඉහත දැක්වූ මව්බිම පුවත් සම්බන්ධයෙන් කර්තෘ මණ්ඩලයට වගකීම බැරවනු ඇත.

කරු ජයසූරිය විසින් 17 ඉරිදා මුල් ලිපියට ලබාදුන් ප්‍රතිචාරයත්, ඒ සම්බන්ධයෙන් පුවත්පතේ ස්ථාවරයත්, මුල් ලිපිය හා සමානම ප්‍රමුඛතාවයකින් යුතුව පළ කිරීමට මව්බිම ගෙන තිබෙනා පියවර නිවැරදි වේ. එසේම ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලිපියද පළ කිරීමට මව්බිම කටයුතු කළ යුතු බව අපි පෙන්වා දෙමු.

අවසන් වශයෙන් ගත් විට, මෙම පුවත සාවද්‍ය බව එයට සම්බන්ධ පාර්ශවයන් දෙකම නිල වශයෙන් ප්‍රකාශ

කර සිටී. මව්බිම පුවත්පත ඒ සම්බන්ධයෙන් දරණ ස්ථාවරය කුමක් වේදැයි පාඨක අපි බලා සිටිමු. මෙය සාවද්‍ය පුවතක් නම්, මව්බිම පුවත්පත නිරවද්‍යතාවය සම්බන්ධයෙන් බරපතළ ආචාර ධාර්මික වරදක් සිදුකර ඇති බවද මෙසේම පෙන්වා දෙමු.

කරු ජයසූරිය විසින් නිකුත් කළ මාධ්‍ය ප්‍රකාශය: https://mcusercontent.com/e5e1192127653987d107e6f98/files/719f7a59-fba7-435d-bafa-4c918c557bf1/2020.05.17_%E0%B6%B8_%E0%B6%B0__%E0%B6%BA_%E0%B6%B1_%E0%B7%80_%E0%B6%AF%E0%B6%B1%E0%B6%BA.pdf

ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කළ ප්‍රකාශය: https://mcusercontent.com/e5e1192127653987d107e6f98/images/035b1f54-84bd-4ace-bbbc-50299117976b.jpg

**#MediaEthics #lka #SinhalaPress #Mawbima**